සැමට මානව අයිතිවාසිකම් සාම ක්‍රියාවලියෙහි දී
සුළුතර කොටස් සතු අයිතිවාසිකම් ව්‍යාපෘතිය

# සුළුතර කොටස් සහ කාන්තා හා ළමා අයිතිවාසිකම්


## ස්වර්ණා ජයවීර
## කමිනා ගුණරත්න



ශ්‍රී ලංකා
මානව හිමිකම් කොමිසම

අනුග්‍රහය · යුරෝපා සංගමය

Acc. 345

# සුළුතර කොටස් සහ කාන්තා හා ළමා අයිතිවාසිකම්

## 1 හැඳින්වීම

කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ ළමයින්ගේ අයිතිවාසිකම් අහිමි කළ නොහැකි අතර ඒවා මානව අයිතිවාසිකම්වලට ඇතුළත්ව පවතී. ශ්‍රී ලංකාවේ සිංහල බහුතර ජනතාවෙන් වෙනස් ලෙස ජනවාර්ගික සුළුතර කොටස් සිටිති.- ශ්‍රී ලංකා දෙමළ, ශ්‍රී ලංකා යෝනක, වතු කම්කරු පිරිස් වැනි වඩාත් මෑතක පැමිණි ඉන්දිය ජනයාගෙන් පැවත එන දෙමළ ජනයා, මැලේ ජාතිකයන් සහ බර්ගර්වරුන් වේ. දේශීය ජන සම්ප්‍රදායමකින් පැවත එන සුළුතර කොට්ඨාසයක් වන වැද්දී ජනයා ඌව පලාතේ පදිංචි අතර මෙම දේශීය ජනයාගෙන් වැඩි කොටස කල් යාමේදී සිංහල හා දෙමළ ජනතාව සමඟ සංකලනය වෙමින් සිටිති. ජනගහණයෙන් වැඩි කොටස බෞද්ධයන් වන අතර, හිංදු, රෝමානු කතෝලික හා අනෙකුත් ක්‍රිස්තියානිවරු සුළුතර කොටස් වෙති. මෙම සියලු ජන කොටස්වල, පුරුෂයන්ගේ, කාන්තාවන්ගේ සහ ළමයින්ගේ අයිතිවාසිකම්, මානව අයිතිවාසිකම් පිළිබඳ සංකල්පයට ඇතුළත් වී තිබේ.

2001 ජන සංගණනය පවත්වන ලද්දේ දිස්ත්‍රික්ක 18 ක පමණි. නැගෙනහිර පලාතේ අම්පාර ද එට ඇතුළත් විය. එබැවින් උතුරු පලාත සහ නැගෙනහිර පලාතේ ත්‍රිකුණාමලය හා මඩකලපු දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් සංගණන දත්ත නොමැත. දිස්ත්‍රික් 18 හි මුළු ජනගහනයෙන් 51% කාන්තාවන් වන අතර එයින් දිස්ත්‍රික්ක 12 ක ජනගහනයෙන් අඩකට වැඩියෙන් කාන්තාවන්ය. මේ අනුව පුම්තිර් අනුපාතය 97.9 කි. (මුළු දිවයිනේම ළමා ජනගහනය අවුරුදු 18ට අඩු) 1981 දී 41.6% ක් වූ අතර දිස්ත්‍රික්ක 18 හි එය32.9 % දක්වා අඩුවී තිබේ. එට හේතුව දරු එල ලැබීමේ මට්ටම්වල පහත වැටීමකි. එමනිසා කාන්තාවන් හෝ ගැහැණු ළමයින් සුළුතර ප්‍රජා කොට්ඨාසවල "සුළුතරයන්" නොවේ. එහෙත් වත්කම්, සම්පත් හා සේවා ලබා ගැනීමේ දී ඔවුහු පිරිමි හා පිරිමි ළමයින් සමඟ සංසන්දනය කරන විට අවාසිදායක තත්ත්වයක සිටින අතර විවිධ ජනවාර්ගික ප්‍රජා කොට්ඨාසවල පුද්ගලික නීති සහ සමාජ සංජානන හා භාවිත අනුව ඔවුහු වෙනස්කම්වලට භාජනය වෙති.

ශ්‍රී ලාංකික දෙමළ ප්‍රජාව ප්‍රධාන වශයෙන් රාශිගතව සිටින්නේ උතුරු පලාතේය. භාෂා ප්‍රතිපත්තිය නිසා ඔවුන් අවාසිදායක තත්ත්වයකට පත්ව සිටින අතර එහි

ප්‍රතිවිපලයක් වශයෙන් ජනවාර්ගික ගැටුම් ඇතිවිය. බහුතර ප්‍රජාවට අයත් කාන්තාවන් සේම මෙම ප්‍රජාවට අයත් කාන්තාවෝ තවදුරටත් වෙනස්කම්වලට භාජනයවී සිටිති. මුස්ලිම් කාන්තාවන්ට බලපාන පුද්ගලික නීති නිසාත් ඔවුන්ගේ ප්‍රගතිය අඩපණ කරන සමාජ-සංස්කෘතික ප්‍රතිමාන නිසාත් ඔවුහු පැහැදිලිවම වෙනස්කම්වලට භාජනය වෙති. වතුකරයේ දෙමළ ප්‍රජාවට දායාදව පවතින සමාජ-ආර්ථික අවාසිදායක තත්ත්වයන් තිබේ. 19 වන ශතවර්ෂයේ සිට 20 වන ශතවර්ෂයේ මුල් කාලය දක්වා ගිවිසුම් ගත කම්කරු ශ්‍රමය සැපයීම මත රටට ගෙනවිත් වතුකරයේ පරිවාස්තිවලට සීමාකරන ලද ඔවුන් සඳහා 20 වන සියවස ආරම්භයේදී යටත් විජිත පරිපාලනය විසින් මනා අභිවාදී ප්‍රතිලාභ ලබාදී තිබුණු නමුදු පශ්චාත්-ස්වාධීන ශ්‍රී ලංකාවේ ඇතිවූ සමාජ සංවර්ධනය ඔවුන් පසෙකින් මගහැරී ගියේය. මෑතක් වනතුරු බලපෑ ඡන්දය අහිමි කිරීම, ඉන්දියාවට යැවීම පිළිබඳ පැටලිලි තත්ත්වයන් සහ වතුකරයේ නිවාස හා ඉඩම් අයිතිය පිළිබඳ පුද්ගලික අයිතිවාසිකම් අහිමිකිරීම වැනිවූ දේශපාලන වර්ධනයේ විපර්යාස ද ඔවුන් කෙරේ බලපෑවේය. වතුකරයේ පවුල්වල කාන්තාවෝ විවෘත පුරුෂාධිපත්‍යයට හා ලිංග භේදය මත අසමානතාවන්ට භාජනය වෙති. වතුකරයේ ළමා ශ්‍රමය පිළිබඳ සිද්ධීය මෑතක් වනතුරු ඉහල තත්ත්වයක පැවතුණි. පුරාණ වාස භූමිවල ජීවත්වන වැද්දනයා සමාජ බැහැර කිරීම්වලට ගොදුරුවී සිටින අතර මහවැලි ප්‍රදේශයේ පදිංචි කරවා ඇති අය පරිදි රජයෙන් පදිංචි කරවා සිටින්නන්ට සමාන අවස්ථා තවමත් බොහෝ දුරස්ථව පවතී. යොතපාලනා නැර ඇති කුල කණ්ඩායම් විස්තෝර තනි වූ ප්‍රජා කොට්ඨාස වශයෙන් ජීවත් වෙති; කොරියස් නම් නැතින් හැඳින් යන පවුල් වශයෙන් ජීවත් වෙති. ඔවුහු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් අයිතිවාසිකම් භුක්ති විඳීමේදී වෙනස්කම්වලට භාජනය වෙති.

මෙම ව්‍යාපෘතිය යටතේ විශේෂයෙන් සැලකිල්ලට භාජනයවන අම්පාර දිස්ත්‍රික්කයේ මිශ්‍ර ජනතාවක් සිටිති. ශ්‍රී ලංකාවේ යෝනක ජනයා 41.6 % ක් ද සිංහලයන් 39.3% ද ශ්‍රී ලංකා දෙමළ 18.7 % ද මැලේ ජාතිකයන් 0.03 % ක් ද එහි වෙති. (2001 ජන සංගණනය)

නෛතික රාමුව සහ සංවර්ධන ප්‍රතිපත්ති සහ වැඩසටහන්වල කාන්තාවන්ගේ සහ ළමයින්ගේ අයිතිවාසිකම් හා ළමයින්ගේ අයිතිවාසිකම් මෙන්ම සුළුතර කොටස්වල අයිතිවාසිකම් එකට සම්බන්ධවන ප්‍රදේශ මෙම පොත් පිංච මඟින් සොයා බලනු ලැබේ.

## II නෛතික රාමුව

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

සියලු පුරවැසියන්ට සිය අයිතිවාසිකම් සම්බන්ධයෙන් යම් යම් සහතික කිරීම් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ලබාදෙයි. මෙම අයිතිවාසිකම් III වන පරිච්ඡේදයේ ඇතුළත් වෙයි. මෙම අයිතිවාසිකම් කාන්තාවන් ඇතුළු පුරවැසි කොටස්වලට අදාළ වෙයි. ඇතැම් වැදගත් අයිතිවාසිකම් ගැන පහත සාකච්ඡා කරනු ලැබේ.

අංක 11 දරණ ව්‍යවස්ථාවට අනුව කිසිම තැනැත්තෙකු වධ හිංසාවලට හෝ කෘෘර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට හෝ දඬුවමකට යටත් නොකළ යුතුය. කාන්තාවන් දූෂණයට හෝ වෙනත් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියාවලට භාජනය කිරීම වධ හිංසාවලට හෝ කෘෘර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට භාජනය කිරීම පිළිබඳ අර්ථකථනයට ඇතුළත් වේ.

නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තකු සිරභාරයට ගැනීම නොකළ යුතු බව 13 වන ව්‍යවස්ථාව සඳහන් කරයි.

සමහරවිට කාන්තාවන් ඇතුළු පුරවැසි කොටස්වල අයිතිවාසිකම් සුරැකීම ඉතාම වැදගත් ව්‍යවස්ථාව වන්නේ 12 වන ව්‍යවස්ථාවයි. නීතිය ඉදිරියේ සියලු පුද්ගලයන් සමාන බවත්, නීතියේ සමාන ආරක්ෂාව ලැබිය යුතු බවත් එහි සඳහන් වෙයි. කිසිම තැනැත්තෙකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය යනුවෙන් එහි වැඩිදුරටත් සඳහන් වෙයි. එමනිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් කාන්තාවන් ඇතුළු සියලු පුරවැසියන්ට සමානත්වය සහතික කරයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇති වෙනත් අයිතිවාසිකම් සමහරක් වන්නේ:

භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළකිරීමේ නිදහසට,

සාමකාමීව රැස්වීමේ නිදහසට,

සමාගමයේ නිදහසට,

වෘත්තීය සමිති පිහිටුවීමේ නිදහස සහ වෘත්තීය සමිතිවලට බැඳීමේ නිදහසට,

එකලාව හෝ කණ්ඩායම් සමඟ, ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව, තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය, ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහසට,

එකලාව හෝ අන් අය සමඟ හෝ ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩි දියුණු කිරීමේ නිදහසට හා ස්වකීය භාෂාව භාවිතා කිරීමේ නිදහසට,

එකලාව හෝ අන් අය සමඟ යම් නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්තවීමේ නිදහසට,

ශ්‍රී ලංකාව තුළ යාම් එම් නිදහසට සහ අභිමත ස්ථානයක වාසය කිරීමේ නිදහසට සහ ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමේ නිදහසට, ඇති හිමිකමයි.

මෙම සියලු අයිතිවාසිකම් නීති මගින් ක්‍රියාත්මක වෙයි. එහි තේරුම වන්නේ පුද්ගලයකු විසින් එවා භුක්ති විඳීමට රජය අවහිර කළහොත් පිළියමක් ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කිරීමට එම පුද්ගලයාට පුළුවන් බවයි.

කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කාන්තාවන්ට පූර්ණ සුරක්ෂිත භාවය ලැබීම වැළැක්විය හැකි මූලික අයිතිවාසිකම් විධිවිධාන පිළිබඳ සීමා කිරීම් කීපයක් පවතී. මෙම සීමා කිරීම්වලට පහත සඳහන් ඒවා ද ඇතුළත් වේ:

> මූලික අයිතිවාසිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකළ හැක්කේ රජය විසින් අයිතිවාසිකම් කඩකළහොත් පමණි. පුද්ගලයකු විසින් හෝ සංවිධානයක් විසින් මෙම අයිතිවාසිකම් කඩකළහොත් එට පිළියමක් නැත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව එවැනි අයිතිවාසිකමක් කඩවී මසක් ඇතුළත ඒ පිළිබඳ පැමිණිල්ල ඉදිරිපත් කළ යුතුය. බොහෝ විට එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට පීඩා විඳි තැනැත්තාට කාලයක් මෙයින් නොලැබේ.
>
> එවැනි ක්‍රියාමාර්ග ගැනීමට බොහෝ කාන්තාවනට හැකියාවක් නොමැත. එහෙත් එවැනි ක්‍රියාමාර්ගයක් ගත හැක්කේ පීඩා විඳි කාන්තාවට පමණි. ඇයට ආධාර කිරීමට කැමති වෙනත් අයට ඇය වෙනුවට සහ ඇගේ නමින් පැමිණිලි කළ නොහැක. ශ්‍රී ලංකාවේ දැනට පවතින බොහෝ නීති මගින්

> කාන්තාවන් වෙනස්කම්වලට භාජනය වෙයි. මෙම විධිවිධාන බොහොමයක් දැකිය හැක්කේ පහත විස්තර කර ඇති පරිදි ඇතැම් ප්‍රජා කොට්ඨාසවලට බලපාන නීතිවලය. එහෙත් එම නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇති කිරීමට පෙර සිට පැවති හෙයින් සමානත්වය සඳහා කාන්තාවකට ඇති අයිතිවාසිකම් මෙම නීති මගින් උල්ලංඝනය කළොත් ඇයට පැමිණිල්ලක් ඉදිරිපත් කළ නොහැක.

මෙම වාද විෂයන් එනම් කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරැකීම සහතික කිරීම පිණිස ඇමතිය යුතු ඒවා වෙයි.

## අන්තර් ජාතික බැඳීම්

කාන්තාවන් වෙනස්කම්වලට භාජනය කිරීම් පිළිබඳ සියලු විධි තුරන් කිරීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (කා.වෙ.සි.තු.ස.) ශ්‍රී ලංකාව විසින් පිළිගෙන තිබේ. අපේ කාන්තාවන්ගේ තත්ත්වය උසස් කරන බවටත්, ඔවුන්ට අයිතිවාසිකම් හිමිවන බවට හා ඔවුන්ට සමාන ලෙස සලකන බවටත්, අන්තර්ජාතික බැඳීමක් මෙම සම්මුතිය මගින් ඇතිකර තිබේ. කාන්තාවන්ගේ තත්ත්වය උසස් කිරීම සඳහා ගෙන ඇති පියවර ගැන ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් කා.වෙ.සි.තු.ස. කමිටුවට කාලයෙන් කාලයට වාර්තා යැවිය යුතුය.

ශ්‍රී ලංකාව විසින් ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ද පිළිගෙන තිබේ. සියලු රටවල් විසින් ළමයින්ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කිරීම පිණිස අන්තර් ජාතික ප්‍රමිති මෙම සම්මුතිය මගින් දක්වා තිබේ. එබැවින් ළමයින් සම්බන්ධයෙන් ඇතැම් ප්‍රමිති පවත්වා ගැනීමට ශ්‍රී ලංකාව ද අන්තර්ජාතික බැඳීම්වලට එකඟවී ඇත.

## ජාතික ප්‍රතිපත්ති ලේඛන

## කාන්තා ප්‍රඥප්තිය

කාන්තා ප්‍රඥප්තිය වනාහි ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් 1993 මාර්තුවේදී අනුමත කළ ලියවිල්ලකි. එය කාන්තාවන්ගේ අයිතිවාසිකම් අරබයා රජයේ ස්ථාවරය සඳහන් කරයි. මෙහි ඇතුළත් විධිවිධාන පදනම් කරගෙන ඇත්තේ කාන්තාවන්

පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියයි. ප්‍රඥප්තියේ සඳහන් අයිතිවාසිකම්වල මූලධර්මවලට සහ ප්‍රතිපත්තිවලට සියලු දෙනා විසින් ගරු කළ යුතු බවත්, සියලු පුද්ගලයන්ගේ, ආයතනවල, සංවිධානවල සහ ව්‍යාපාරවල ක්‍රියාවන්වලට එමගින් මග පෙන්විය යුතු බවත් ප්‍රඥප්තියේ පූර්විකාවේ (හැඳින්වීමේ) දැක්වේ. කෙසේ වෙතත්, මෙම ප්‍රඥප්තිය නෛතික වශයෙන් බැඳීමක් ඇති ලියවිල්ලක් නොවන බව මතක තබාගැනීම වැදගත්ය. මෙහි අදහස වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ වෙනත් නීතිවල ඇති මූලික අයිතිවාසිකම් මෙන් නොව මෙහි විධිවිධාන උසාවි මගින් බලාත්මක කළ නොහැකි බවයි. ජීවිතයේ සියලු අංශවල දී කාන්තාවන්ගේ තත්ත්වය වැඩිදියුණු කළ හැක්කේ කෙසේ ද යන්නට මගපෙන්වීමක් වශයෙන් පමණක් එය ප්‍රයෝජනවත් වේ.

මෙම ප්‍රඥප්තියේ පහත සඳහන් ක්ෂේත්‍රවලට අදාළ විධිවිධාන ඇතුළත්වේ.

දේශපාලන හා සිවිල් අයිතිවාසිකම්,

පවුල තුළ අයිතිවාසිකම්,

අධ්‍යාපනයට හා පුහුණුවට අයිතිවාසිකම,

ආර්ථික කටයුතුවලට හා ප්‍රතිලාභවලට අයිතිවාසිකම්,

සෞඛ්‍ය ආරක්ෂාවට හා පෝෂණයට අයිතිවාසිකම,

සමාජ වෙනස්කම්වලට භාජනය වීමෙන් ආරක්ෂාවීමට ඇති අයිතිවාසිකම,

ස්ත්‍රී-පුරුෂ භේදය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වයෙන් (එනම් කාන්තාවන්ට (විරුද්ධ ප්‍රචණ්ඩත්වයෙන්) ආරක්ෂා වීමට අයිතිවාසිකම.

## ළමා ප්‍රඥප්තිය

කාන්තා ප්‍රඥප්තිය මෙන්ම ළමා ප්‍රඥප්තිය ද ශ්‍රී ලංකාවේ ළමයින් පිළිබඳ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය පැහැදිලි කරයි. මෙම ප්‍රඥප්තියෙන් ආවරණයවන වැදගත් ක්ෂේත්‍ර පහත දැක්වේ:

වෙනස්කම්වලට භාජනය නොකිරීම,

ළමයාගේ පරම සුභ සිද්ධිය,

පවුල් ජීවිතය සහ මවුපියන්ගේ අයිතිවාසිකම් සහ වගකීම,

ජීවිතයට, ජීවත්වීමට සහ සංවර්ධනයට අයිතිවායිකම්,

නමක් සහ ජාතිකත්වය සඳහා අයිතිවායිකම,

අනන්‍යතාවය ආරක්ෂා කරගැනීම,

සුදුසු තොරතුරුවලට ප්‍රවේශවීම,

අපචාරයන් සහ නොසලකාහැරීමෙන් ආරක්ෂාවීම,

දරුකමට හදා ගැනීම,

සරණාගත ළමයි,

ආබාධිත ළමයි,

සෞඛ්‍ය ආරක්ෂාව,

ජීවන තත්වය,

අධ්‍යාපනය,

ළමා ශ්‍රමය, මත් ද්‍රව්‍ය භාවිතය, ළමයින් වෙළදාම, ලිංගික වශයෙන් ආත්මාර්ථය පිණිස යොදා ගැනීම, පැහැර ගෙන යෑම යන මේවායින් ආරක්ෂාවීම,

වධ හිංසාවලින්, නිදහස අහිමි කිරීමෙන් සහ සන්නද්ධ ගැටුම්වලට මැදිවීමෙන් ආරක්ෂාවීම.

''සුළුතර කොටසකට අයත් හෝ ස්වදේශීය හෝ ළමයෙකුට ඔහුගේ හෝ ඇගේ කණ්ඩායමේ අනිකුත් සාමාජිකයන් සමග ඔහුගේ හෝ ඇගේ සංස්කෘතිය භුක්ති විඳීමේ අයිතිය, ඔහුගේ හෝ ඇගේ ආගම දේශනා කිරීමේ හෝ පුහුණු කිරීමේ අයිතිය, ඔහුගේ හෝ ඇගේ භාෂාව පාවිච්චි කිරීමේ අයිතිය අහිමි නොකළ යුතුය'' යනුවෙන් සුළුතර කොටස්වල ළමයින් ගැන සඳහන් විධිවිධාන විශේෂයෙන් අදාළවෙයි.

## නීති බලාත්මක කිරීම සහ අපරාධ යුක්තිය

## කාන්තාවන්ට සහ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය

දණ්ඩ නීති සංග්‍රහය වූකලී පුද්ගලයෙකුට එරෙහිව නොකළ යුතු සාපරාධී වරදවල් ඇතුළත් නීතියයි. එය කිසිදු භේදයක් නොමැතිව ශ්‍රී ලංකාවේ සියලු පුද්ගලයන්ට බලපැවැත්වෙයි. කාන්තාවන්ට එරෙහිව සිදුවන වරදවල් පිළිබඳ විධිවිධාන ගණනාවක් මෙම සංග්‍රහයේ ඇතුළත්ව තිබේ. දූෂණය, ලිංගික අතවර, ව්‍යභිචාරය බරපතල ලිංගික අපචාරය සහ කාන්තාවන් වෙළඳාම ඒවා අතර වෙයි. කාන්තාවන්ට එරෙහිව සිදු විය හැකි අනිකුත් වරදවල් අතර තුවාල සිදු කිරීම සහ බරපතල තුවාල සිදු කිරීම ද වෙයි. ගෘහ ප්‍රචණ්ඩත්වය ශ්‍රී ලංකාවේ බරපතල මෙන්ම සියලුම ප්‍රජාවන්ට අයත් කාන්තාවන්ට බලපාන ගැටළුවක් නමුදු එය ඇමතීමට කවරම නීතියක් සකසා නොමැත.

දූෂණයට සම්බන්ධ නෛතික විධිවිධාන 1995 දී සංශෝධනය කොට දැඩි කරන ලදී. එම වරදට අදාළ දඬුවම් ද වැඩි කරනු ලැබීය. නීති දැඩි කර ඇති නමුදු කාන්තාවන් ප්‍රචණ්ඩත්වයෙන් බේරා ගැනීම සඳහා ඊට වැදගත් භාවයක් පොලිසිය විසින් ආරූඪ නොකරනු ලබන හෙයින් නීති බලාත්මක කිරීම තවමත් ගැටළුවක්ව පැවතීම කණගාටුවට කරුණකි.

1995 දී පනවනු ලැබූ නව නීති මගින් ළමයින්ට සිදුවිය හැකි අතවර පිළිබඳ නව වරදවල් කිපයක් ද හඳුන්වා දෙන ලදී. මේවා සියලු ප්‍රජා කොට්ඨාසවල ළමයින් කෙරේ බලපායි. අළුත් විධිවිධානවලට අනුව අසභ්‍ය දර්ශන සඳහා ළමයින් යොදා ගැනීම, ලිංගිකව ළමයින් අපයෝජනය, ළමයින්ට අමානුෂික ලෙස සැලකීම සහ ළමයින් වෙළඳාම සඳහා යොදා ගැනීම ද වරදවල් වෙයි.

## පුද්ගලික නීති

විවාහය, දික්කසාදය, දේපල උරුමය යනාදී කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ඇතැම් ජනවාර්ගික සහ ආගමික ප්‍රජාවෝ ඔවුන්ගේ පුද්ගලික නීති මගින් පාලනය කරනු ලබති. අනිකුත් සියලුම දෙනා පාලනය කරනු ලබන්නේ රටේ පොදු නීතිය මගිනි. මෙම පුද්ගලික නීති සම්භාරයෙහි කාන්තාවන් වෙනස්කම්වලට භාජනය කරනු ලබන විධිවිධාන ඇතුළත්ව තිබේ.

## තේසවලාමි නීතිය

තේසවලාමි නීතිය උතුරු පළාතේ දෙමළ වැසියන්ට බලපායි. මේ නීතිය අනුව විවාහක කාන්තාවකට ගිවිසුම්වලට බැඳීමට සහ නිශ්චල දේපල තමන්ගේම වුවද ඒවා අන්සතු කිරීම සඳහා තම ස්වාමි පුරුෂයාගේ එකඟත්වය තිබිය යුතුය.

## මුස්ලිම් නීතිය

මුස්ලිම් නීතිය මුළු රටේම වෙසෙන මුස්ලිම් ජාතිකයන්ට බලපායි. 1995 ට පෙරාතුව මුස්ලිම්වරුන්ට විවාහයට ඇතුළත්වීමේ අවම වයස තීරණය වූයේ ස්ත්‍රී දූෂණය පිළිබඳ නීති අනුවයි. ඒ නීතිය අනුව අවුරුදු 12 කට අඩු කාන්තාවක සමග සංසර්ගයේ යෙදීම තහනම් විය. 1995 දී මෙම අවම වයස් සීමාව අවුරුදු 16 දක්වා වැඩි කරන ලදී. එහෙත් මෙම නව විධිවිධානයෙන් මුස්ලිම් ජාතිකයන් නිදහස් කෙරේ. ඒ අනුව තමන්ගේ කැමැත්ත නොමැතිව වුව ද අවුරුදු 12 වයසේ මුස්ලිම් ජාතික ගැහැණු ළමයින් විවාහ කර දීමට පුළුවන.

මුස්ලිම් කාන්තාවන් වෙනස්කම්වලට භාජනය වන තවත් ක්ෂේත්‍රයක් වන්නේ දික්කසාදය සම්බන්ධයෙනි. කිසිදු හේතුවක් නොදක්වා මුස්ලිම් ජාතිකයකුට තම භාර්යාව දික්කසාද කළ හැක. කෙසේ වෙතත් මුස්ලිම් කාන්තාවකට තම සැමියාගෙන් දික්කසාද වීමට අවශ්‍ය නම් ඔහු තමාට හිරිහැර කළ බව හෝ තමන් අයිති නිකායට බලපාන නීතිය අනුව පිළිගත හැකි වෙනත් වැරැද්දක් පැවැති බව ඔප්පු කළ යුතුය.

දේපල උරුමවීම අනුව ද පියාගේ දේපලවලින් දියණිවරුන්ට හිමිකම් ඇත්තේ පුතුන්ට ඇති කොටස්වලට වඩා අඩු කොටසක් සඳහාය.

## උඩරට නීතිය

උඩරට සිංහල ජනයාට බලපාන උඩරට නීතියේ ද කාන්තාවන් වෙනස්කම්වලට භාජනය කිරීම් පවතී. නිදසුනක් වශයෙන් කලත්‍රයා මළ පසු ඔහු ඇය සතු දේපළවලට ජීවත්ව සිටින කලත්‍රයා හිමිකම් ලබන්නේ ජීවත්ව සිටින තුරු භුක්ති විඳීමට පමණි. මෙම නීතිය පිරිමින් සහ කාන්තාවන් යන දෙපක්ෂයටම වලංගුවන නමුත් එය කාන්තාවන්ට වැඩියෙන් බලපායි. මක්නිසා ද යත් ඔවුන්ට බොහෝ විට තිබෙන්නේ වඩාත් අඩු ආදායමක් නිසාත් විශේෂයෙන්ම පුරුෂයාගේ අභාවයෙන් පසු වැඩියෙන් ආර්ථික උදව් උපකාර අවශ්‍යවන නිසාත් ය.

දික්කසාදවීම් සම්බන්ධයෙන් ද කාන්තාවන් වෙනස්කම්වලට භාජනය කරනු ලැබේ. විවාහයෙන් පසු අනාචාරයේ හැසිරීමේ හේතුව මත තම භාර්යාව දික්කසාද කිරීමට සැමියෙකුට පුළුවන. එහෙත් එම හේතුවම නිසා තම සැමියා දික්කසාද කිරීමට අපේක්ෂා කරන භාර්යාවකට ඊට අමතරව ව්‍යභිචාරය හෝ නෑදෑබල අනාචාරය ඔප්පු කිරීමට සිදුවේ.

## සෙසු නීති

කාන්තාවන් පොදුවේ වෙනස්කම්වලට භාජනය කරන සහ සියලු ප්‍රජාවන්වල කාන්තාවන්ට බලපාන වෙනත් නීති සහ පරිපාලන භාවිත ගණනාවක් තිබේ. නිදසුනක් වශයෙන් කෘෂිකාර්මික ජනපද ව්‍යාපාරවල ඉඩම් ප්‍රදානය කිරීම් කාන්තාවන් අබිබවා පිරිමින්ට අනුග්‍රහය දක්වයි. පොදුවේ මෙම ප්‍රදානයන් කරන්නේ පිරිමින්ටයි. තවද මුල් හිමිකරු මිය ගිය පසු, ඔහු විසින් අනුප්‍රාප්තිකයකු නම්කර නැත්නම් ඉඩම ලබාගැනීම සඳහා හිමිකම් ඇති ලැයිස්තුවේ පිරිමි හිමිකරුවන්ට කාන්තා හිමිකාරියන්ට වඩා අනුග්‍රහයක් ලැබේ. නිදසුනක් වශයෙන් වයස ගැන නොතකා දියණියන්ට වැඩියෙන් පුතුන්ට මුල් තැන දෙනු ලැබේ. ඉඩම් හිමිකරු තම අනුප්‍රාප්තිකයා වශයෙන් තම භාර්යාව නම්කර නැත්නම් අනුප්‍රාප්තිය ලැබීමට ඇයට වැඩි අයිතිවාසිකමක් ඇති නමුදු එම අයිතිවාසිකම් සීමිත වෙයි. ඇය නැවත විවාහ වුවහොත් ඉඩම නැවත ආපසු දිය යුතුය. තවද අනුප්‍රාප්තිකයකු නම් කිරීමට ද ඇයට අවසර නැත.

## විශේෂ ක්‍රියාමාර්ග

12 වන ව්‍යවස්ථාවේ ඉතා වැදගත් විධිවිධානයක් ඇතුලත්කර තිබේ. මේ වගන්තිය අනුව කාන්තාවන්ගේ, ළමයින්ගේ සහ ආබාධිත තැනැත්තන්ගේ තත්ත්වය දියුණුකිරීම සඳහා රජයට විශේෂ ක්‍රියාමාර්ග ගත හැක. මෙයින් අදහස් කරන්නේ පිරිමින් ගැන සසඳන විට කාන්තාවන් සහ ළමයින් අවාසිදායක තත්ත්වයක සිටින බව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව පිළිගන්නා බවයි. එම නිසා මෙම විශේෂ විධිවිධාන වලින් පිරිමින්ට නොලැබෙන වාසි කාන්තාවන්ට හා ළමයින්ට දෙනවා වුව ද ඔවුන්ගේ තත්ත්වය පිරිමින්ගේ තත්ත්වයට උසස් කිරීම පිණිස මෙම විධිවිධානවලට ඉඩ ලැබෙනු ඇත.

## නීති සංශෝධන සඳහා නිර්දේශ

කාන්තාවන්ට සිය මූලික අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා තිබෙන පිළියම් වර්ධනය කිරීම පිණිස ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතුය.
නිශ්චිත සංශෝධන මෙවාය:

- මූලික අයිතිවාසිකම් නීති කෘත්‍යයක් සඳහා නියම කර ඇති එක් මසක කාල සීමාව ප්‍රමාණවත් නොවන හෙයින් එය දීර්ඝ කිරීම,
- පෙර සඳහන් කළ පරිදි කාන්තාවන් වෙනස්කම්වලට භාජනය කරන නීති නැවත සලකා බලා එම නීති අවලංගු කිරීමට උසාවිවලට බලය දිය යුතුය,
- කාන්තාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කළ හැක්කේ රජයට පමණක් නොවන හෙයින් මූලික අයිතිවාසිකම් විධිවිධාන පෞද්ගලික අංශයට ද බලාත්මක වන පරිදි දීර්ඝ කළ යුතුය; මෙය කාන්තාවන් බොහෝ විට වෙනස්කම්වලට භාජනය කරනු ලබන රැකියා නියුක්තිය වැනි ක්ෂේත්‍රවලදී විශේෂයෙන් වැදගත්වේ,
- නීතියේ පිහිට පැතීමට උසාවි කරා යෑමට නොහැකි කාන්තාවන් වෙනුවෙන් උසාවිවල නඩු පැවරීමට කැමති තැනැත්තන්ට හෝ සංවිධානවලට ඒ සඳහා ඉඩකඩ ලබා දීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සැලැස්විය යුතුය.

- මීට අමතරව කාන්තාවන් වෙනස්කම්වලට භාජනය කරන සියලු නීති ප්‍රතිශෝධනය හා සංශෝධනය කළයුතුය-නිදසුනක් වශයෙන් ඉඩම් සංවර්ධන ආඥාපනත දැක්විය හැක,
- කාන්තාවන් විසින් සමාන අයිතිවාසිකම් භුක්ති නොවිඳින සහ ඔවුන් විශේෂිත ගැටළුවලට මුහුණපාන ක්ෂේත්‍රවල ඔවුන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි අවශ්‍ය නැත්නම් විශේෂ විධිවිධාන යෙදිය යුතුය.

## III සංවර්ධන ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්තිවල පැහැදිලි රාමුවක් හෝ/ අඛණ්ඩතාවයක් නොමැති අතර ඒ වෙනුවට සැලසුම් ක්‍රියාවලියේ තිබී ඇත්තේ ඒ ඒ අවස්ථාවට ගැලපෙන තීරණ ගැනීමේ ක්‍රමයකි. එසේ නමුදු, රාජ්‍ය මන්ත්‍රණ සභා පරිපාලන සමයේ (1939-1947) පැවති ධනාත්මක අධ්‍යාපන ප්‍රතිපත්ති පැහැදිලි ලෙසට සියලු ළමයින්ගේ අධ්‍යාපනය කෙරෙහි නාභිගත කර තිබුණි. 1975 අන්තර්ජාතික කාන්තා දිනය දක්වාම මාතෘත්වය පිළිබඳව හැර සංවර්ධන සැලසුම් තුළ කාන්තාවන් දක්නට නොලැබුණි. ඉන් පසුව වුවද "ලිංග භේදයක් නොමැති" සේ සලකනු ලැබූ සංවර්ධන ප්‍රතිපත්ති තුළ, කාන්තාවන්ගේ බහුවිධ භූමිකා පිළිබඳව මෙන්ම ප්‍රතිපත්තිවල ඝටනය කාන්තාවන් කෙරෙහි බලපෑම පිළිබඳව "ලිංග භේද අන්ධ භාවයක්" පැවතුනි. සංවර්ධන ක්‍රියාවලිය තුළ දැ. දත්ත රැස්කිරීමේදී, දර්ශක වර්ධනය කිරීමේ දී හෝ ඝටනය තක්සේරු කිරීමේදී ද ලිංග භේදයට මුල් තැනක් දී ඇති බවට තිබෙන සාක්ෂි ඉතා අල්ප හෙයින්, සංවර්ධන ප්‍රතිපත්තිවල ලිංග භේදයට මුල් තැනක් දීම තවමත් අරමුණක් පමණි. මධ්‍යම සිට ප්‍රාදේශීය මට්ටමේ සැලසුම් ක්‍රියාවලියේ නියුක්ත බොහෝ තැනැත්තන්ට ලිංගභේද කරුණු පිළිබඳ දැනුමක් නොමැති බවත්, ලිංග භේද තක්සේරු කටයුතුවල නියතවීමට අවශ්‍ය නිපුණතාවන්ගෙන් ඔවුන් සන්නද්ධ නොමැති බවත්, මෑතකදී කර ඇති අධ්‍යයනයක් මගින් හෙළිවී ඇත. දැනට පවතින තත්ත්වයේ නිදර්ශනයක් වශයෙන් දුප්පත්කම අඩුකිරීමේ උපාය මාර්ග, නව රැකියා ප්‍රතිපත්තිය හා කාන්තාවන් සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම අතර සම්බන්ධතා ඌනතාවය දැක්විය හැක. මේ අංශ තුනම 2002 දී ඉදිරිපත් කරන ලදී. ළමයින් ගැන සලකන විට ආබාධිත ළමයි, වීදි ළමයි, වැඩ කරන ළමයි, අතහැර දමා ඇති හෝ අනාථ ළමයි, රිමාන්ඩ් බන්ධනාගාර හා රැඳවුම්

මධ්‍යස්ථාන සහ බන්ධනාගාරවල සිටින ළමයි සහ ප්‍රතිපත්ති සහ වැඩසටහන්වලදී සැලකිල්ලට භාජනය නොවීමට ඉඩ ඇති සන්නද්ධ ගැටුම්වලට මැදිවූ ළමයි සිටිති.

උප්පතුන්, සමාජය විශයෙන් අසරණ භාවයට පත් ප්‍රජා කොට්ඨාස, කාන්තාවන් හා ළමයින් යන අයගේ අයිතිවාසිකම් පිළිබඳව සර්වග්‍රාහී පර්යාලෝචනයක් නොතිබීම ජනතාවගේ සියලු කොටස් අතර සංවර්ධන ප්‍රතිලාභ සාධාරණ අන්දමින් බෙදාහැරීම සඳහා පවතින ප්‍රධානතම බාධකයක් වෙයි. ප්‍රතිපත්ති සාදන්නන්, සැලසුම්කරුවන් සහ සියලු මට්ටම්වල සැලසුම් ක්‍රියාත්මක කරන්නන් අතර ස්ත්‍රී-පුරුෂ දත්ත කොටස් කිරීම,
වාසිදායක තත්ත්වයේ සිටින ප්‍රජාවන් පිළිබඳ දත්ත රැස්කිරීම, ප්‍රතිපත්ති සහ සැලසුම් වැඩසටහන්වලදී මානව අයිතිවාසිකම්, මානව සංවර්ධනය, සමාජ සාධාරණය සහ ස්ත්‍රී-පුරුෂ සමාන භාවය පිළිබඳ රාමුවක් තුළ අවාසි දායක තත්ත්වයේ සිටින කණ්ඩායම්වලට අයත් අය ඇතුළුව කාන්තාවන්ගේ සහ ළමයින්ගේ අවශ්‍යතාවලට ප්‍රමුඛත්වයක් දීම ගැන දැනුවත් භාවයක් ඇතිකිරීමේ හදිසි අවශ්‍යතාවයක් පවතී.

## අධ්‍යාපනය

## ප්‍රතිපත්ති රාමුව

සියලු ළමයින්ට අධ්‍යාපනයක් ලැබීමට ඇති අයිතිවාසිකම, ඒ පිළිබඳ අන්තර්ජාතික ප්‍රතිමාන සහ නීත්‍යානුකූල ලේඛන වර්ධනය වීමට දසක 6 ක කාලයක පමණ සිට ශ්‍රී ලංකාව තුළ පිළිගෙන තිබේ. අධ්‍යාපනය සඳහා ඇති “ප්‍රජාතාන්ත්‍රික අයිතිය” සහතික කිරීම සඳහාත්, සියලු දෙනාටම අධ්‍යාපනය තුළින් සමාජ-ආර්ථික උසස්වීමක් ලබාගැනීමට අවස්ථා සැලසීම සඳහාත්, සමාජ-ආර්ථික අසමානතා අඩු කිරීම සඳහාත් 1945 දී නිදහස් ප්‍රාථමික, ද්විතිය අනිවාර්ය සහ තාතීය අධ්‍යාපනය හඳුන්වා දෙන ලදී.
සහ තාතීය අධ්‍යාපනය බලාත්මක කිරීම සඳහා බලය පැවරෙන නීති 1939 අංක 31 දරණ අධ්‍යාපන ආඥාපනත යටතේ රෙගුලාසි මගින් අවුරුදු 5 කට වැඩි කාලයක් යනතුරුම ඉදිරිපත් නොකිරීම කණගාටුවට කරුණකි. කෙසේ වෙතත් ස්ත්‍රී-පුරුෂ භේදය, පන්තිය, ජනවාර්ගික භාවය හෝ කුලය නොතකා විශේෂයෙන්ම ද්විතිය හා උසස් අධ්‍යාපන මට්ටම්වලදී නිදහස් අධ්‍යාපනය ලැබීමට ඉඩ කඩ සැලසීම ද ශිෂ්‍යත්ව වැනි දිරිගැන්වීම් නිසා ද 1960 ගණන් වන විට සාමාන්‍ය අධ්‍යාපනයට ප්‍රවේශවීමේදී ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේ සමාන භාවයක්

බිහි කිරීමට තරම් අධ්‍යාපන කටයුතු වේගවත් විය. ඒ අනුව 1 සිට 11 දක්වා ශ්‍රේණි දක්වා නොමිලේ පාඩම් පොත් ලබාදීම හා පාසල් නිල ඇඳුම් සඳහා නොමිලයේ රෙදි ලබා දීම ආදි වූ තවත් දිරිගැන්වීම් හඳුන්වා දී තිබිය දී දුප්පත්කම හා ප්‍රතිපත්ති පූර්වතාවන්ගේ වෙනස්වීම් නිසා ප්‍රාථමික මට්ටමෙන් පවා සියලු දෙනාටම අධ්‍යාපනයක් ලබාදීමට හැකිවී නොමැත.

පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාව විසින් කාන්තාවන් වෙනස්කම්වලට භාජනය කිරීම පිළිබඳ සියලු විධි ඉවත් කිරීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (කාන්තා සම්මුතිය) සහ ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (ළමා සම්මුතිය) යන අන්තර් ජාතික නීත්‍යනුකූල ලේඛන පිළිගෙන ඇති අතර ජනතාවේ සියලු අංශ වෙත අධ්‍යාපනික අවස්ථා දීර්ඝ කිරීම පිළිබඳ උනන්දුව ඇති කළ "සියලු දෙනාටම අධ්‍යාපනය" පිළිබඳ ජොම්ටියන් ප්‍රකාශනය 1990 දී සහතික කර තිබේ. අනිවාර්ය සහ නිදහස් අධ්‍යාපනය සඳහා සියලුම ළමයින්ට ඇති අයිතිය මෙම නීත්‍යනුකූල ලේඛන හා ප්‍රකාශන මගින් පෙන්වා දී තිබේ. සුළුජන කොට්ඨාසවල ළමයින්ට සිය ආගමට හා සංස්කෘතියට ඇති අයිතිවාසිකම් ද ආබාධිත ළමයින්ට සහ සරණාගත ජනතාවන්ට අයිති ළමයින්ට අධ්‍යාපනයට ඇති අයිතිවාසිකම ද, මානව ගරුත්වයට අනුරූපවන ආකාරයේ පාසල තුළ විනය ද, ළමයාගේ පෞරුෂ වර්ධනය සහ වගකීම් සහිත ජීවිතයකට ඔවුන් සූදානම් කිරීම ද, ලිංගික අපයෝජනයෙන් සහ ආර්ථික සූරාකෑමෙන් ළමයින් ආරක්ෂා කරගැනීම ද ළමා සම්මුතියේ විධිවිධානවලට ඇතුළත්වෙයි. කාන්තා ප්‍රඥප්තිය (1993) අවුරුදු 10 ක අනිවාර්යය අධ්‍යාපනයක් යෝජනා කළ අතර කාන්තා සම්මුතිය සහ කාන්තා ප්‍රඥප්තිය යන දෙකම විෂය මාලාවේ, අධ්‍යාපන මෙවලම්වල සහ පාසල් පරිසරයේ ස්ත්‍රී-පුරුෂ භේදමය භූමිකා ඒකාකෘති ඉවත් කිරීමට ප්‍රමුඛස්ථානයක් දෙයි.

ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ (1978) ප්‍රතිපත්ති විධාන තුළින් "නූගත්කම සහමුලින් ම තුරන් කිරීම සහ සියලු තැනැත්තන්ට අධ්‍යාපනයේ සෑම අවස්ථාවකදී ම සර්ව සාධාරණ හා සමාන ඉඩ ප්‍රස්තා ලබා ගැනීමේ අයිතිය සහතික කිරීම (ව්‍යවස්ථා 27 (2) (ඌ)ප්‍රකාශ කරන අතර, ළමයින් සහ යෞවනයන් කායික වශයෙන්, මානුෂික වශයෙන් සදාචාරාත්මක වශයෙන්, ආගමික වශයෙන් හා සාමාජීක වශයෙන් පූර්ණ වර්ධනයට පත්වන බවට වගබලා ගැනීමටත් ඔවුන් ආත්මාර්ථය පිණිස යොදා ගනු ලැබීමෙන් සහ වෙනස්කම්වලට පාත්‍ර කරනු ලැබීමෙන් ආරක්ෂා කර ගැනීමටත් හැකිවන පරිදි ඔවුන්ගේ සුභසිද්ධිය රජය විසින් විශේෂ පරිශ්‍රමයකින් යුතුව වර්ධනය කිරීමටත්", (ව්‍යවස්ථා අංක 27 (13)) ඉලක්කයක් ප්‍රකාශ කර තිබේ.

1997 ඉදිරිපත් කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් 5-14 කණ්ඩායමට අනිවාර්ය අධ්‍යාපනය නියම කළ අතර එක් කොට්ඨාසයක අඩුතරමින් එක් පාසලක්වත් ''උත්කෘෂ්ට මධ්‍යස්ථානයක්'' වශයෙන් උසස් කිරීමට යෝජනා කරන ලදී. තවද ළමයාගේ සාකල්‍ය වර්ධනය මෙන්ම අධ්‍යාපනයේ අදාළත්වය සහ උත්කෘෂ්ට භාවය සඳහා ප්‍රාථමික අධ්‍යාපනයේ, ද්විතීය, විශ්ව විද්‍යාලීය හා වෘත්තීය අධ්‍යාපනයේ විෂයමාලා ප්‍රතියෝජිත ආරම්භ කරන ලදී.

5-14 වයස් කාණ්ඩය අතර අධ්‍යාපනයට සහභාගිවීමේ සහ සාක්ෂර භාවයේ උසස් දර්ශක ඇතිවීමටත් දුප්පත් කණ්ඩායම් සැලකෙන ප්‍රමාණයක් ඇතුළත් අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ද්විතීය සහ උසස් අධ්‍යාපනය ලබන ප්‍රමාණය පුළුල් වීමත් මෙම ධනාත්මක ප්‍රතිපත්ති නිසා සිදුවී තිබේ. එහෙත් අධ්‍යාපනය ලබාදීම, එට සහභාගිවීම සහ ප්‍රතිඵල ලැබීම් අතින් පවතින වෙනස්කම් අවාසිදායක තත්ත්වයේ සිටින ප්‍රජා කොට්ඨාස අධ්‍යාපනයට ප්‍රවේශවීම පිළිබඳ සැලකිය යුතු අසමානතාවයක් පෙන්නුම් කරයි.

## අධ්‍යාපන පහසුකම් සැපයීම

මිශ්‍ර පාසල් ප්‍රතිශතය උසස් මට්ටමක පැවතීම මගින් අධ්‍යාපනයට ප්‍රවේශවීම පිළිබඳ ස්ත්‍රී-පුරුෂ සමානත්වය ප්‍රවර්ධනය කර ඇති බව සමස්තයක් වශයෙන් පෙන්නුම් කරයි. රටේ පවතින පාසල්වලින් 97% ක් වන රජයේ පාසල් සියල්ලෙන් 96.6% ක් මිශ්‍ර පාසල්ය. සම්පූර්ණ පාසල් ක්‍රමය තුළින් දිගටම තමන්ගේ භාෂාවෙන් අධ්‍යාපනය ලැබීමට සෑම පුද්ගලයෙකුටම අයිතිවාසිකමක් තිබේ. රජයේ පාසල්වලින් 71.1% ක් සිංහල මාධ්‍යයෙන් ද 28.9 % ක් දෙමළ මාධ්‍යයෙන් ද ක්‍රියාත්මක වේ-(2001 වාර්ෂික පාසල් සංගණනය). කෙසේ වෙතත් නාගරික හා ග්‍රාමීය වෙනස්කම් පුළුල් ලෙසින් පවතී. 12 සහ 13 ශ්‍රේණිවල විද්‍යා අධ්‍යාපනය ලබා දෙන්නේ ග්‍රාමීය පාසල්වලින් 4% ක් පමණක්වන අතර නාගරික පාසල්වල එය 28% කි. ඒ අනුව ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන සියළු ජනවාර්ගික කණ්ඩායම්වල කාන්තාවෝ සහ ළමයි හොඳ තත්ත්වයේ ද්විතීය අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශ වීම සම්බන්ධයෙන් අවාසිදායක තත්ත්වයක සිටිති. 1990 ගණන්වල සිටා මගින් ලබාදුන් සැලකෙන ප්‍රමාණයක ආධාර මගින් වතුකරයේ අධ්‍යාපනයේ ප්‍රමාණය හා තත්ත්වය අතින් දියුණුවක් ඇතිවී තිබෙන නමුදු ග්‍රාමීය අංශයට අයත් වතුකරයේ කාන්තාවන් සහ ළමයින් වූ කලී ඉතාමත් අවාසිදායක තත්ත්වයක පසුවන කොටස වෙයි. ''සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයක'' පවතින සම්පත් ඌණතා ප්‍රශ්නය නිසා අධ්‍යාපන පහසුකම්වලට සම්පත් ලබාදීම සීමා වී තිබෙන අතර, අන්තර්ජාතික මූල්‍ය ආයතනවලින් ණය ලබාගැනීම

කෙරෙහි වැඩියෙන් යැදී සිටීමට සිදුවී ඇත. 1960 ගණන්වලදී අධ්‍යාපන වියදම් දළ දේශීය නිෂ්පාදනයෙන් 5% ක් වූ අතර 1980 ගණන් වලදී එය 2-3% ත් අතර ප්‍රමාණයකට පහත වැටුණි. එය 1960 ගණන්වල අයවැයෙන් 20 % සිට 1980 ගණන් වන විට 8-10% දක්වා පහත වැටීමකි.

## අධ්‍යාපනයේ නිරතවීම

2001 සංගණන දත්ත ලැබී නොමැත. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිය විශාලතම ජාතික සමීක්ෂණයෙන්, එනම් (1994) පවත්වන ලද ජන විකාශන සමීක්ෂණයෙන් සංඛ්‍යාලේඛන ලබා ගන්නා ලදී. පුරුෂ හා ස්ත්‍රී වයස් විශේෂී අධ්‍යාපන සහභාගිත්ව ප්‍රමාණ ප්‍රාථමික අධ්‍යාපන වයස් කාණ්ඩවල (අවුරුදු 5-9 දක්වා) 84% සහ 83.9% ක් ද කණිෂ්ඨ ද්විතීයික වයස් කාණ්ඩය (අවුරුදු 10 - 14 දක්වා) සඳහා 94.3% සහ 94.4% ක් ද, එනම් 5-14 අනිවාර්ය වයස කාණ්ඩයේ 89.4% ක් සහ 89.5% ක් ද, 15-19 වයස් කාණ්ඩයේ 53.4% ක් සහ 55.3% ක් ද, 20-24 වයස් කාණ්ඩයේ 4.7% ක් සහ 4.6% ක් ද විය. සෑම මට්ටම්වලම පාසල් අධ්‍යාපනය සඳහා ලේඛන ගතව සිටි ගැහැණු ළමයින්ගේ ප්‍රතිශතය 1-5 දක්වා ශ්‍රේණිවල 48.8% ක් ද, 6-8 දක්වා ශ්‍රේණිවල 49.1% ක් ද, 9-11 දක්වා ශ්‍රේණිවල 50.7% ක් ද, 12-13 දක්වා ශ්‍රේණිවල 56.5% ක් ද විය. මේ අනුව පිරිමි ළමයින් අතර අධ්‍යාපනය මඟදී අතහරින ප්‍රමාණය ගැහැණු ළමයින්ගේ ප්‍රමාණයට වැඩිවන හෙයින්, ද්විතීය ශ්‍රේණිවල පිරිමි ළමයින්ට වඩා ගැහැණු ළමයි ලේඛන ගතව සිටිති.

නොයේ වෙනත් නාගරික අඩු ආදායම් ප්‍රදේශවල සහ ඈත පිටිසර ප්‍රදේශවල සහ වතුකරයේ අධ්‍යාපනය මඟදී අතහැර යෑමේ ප්‍රමාණය වඩාත් ඉහළ හෙයින් මෙම සාර්ව දත්ත තුළ පුළුල් වෙනස්කම් සැඟවී තිබේ. ලිපිද්‍රව්‍ය, ඇඳුම්, සපත්තු සඳහා යන වියදම් වැනි පුද්ගලික වැය දැරීමට දුප්පත් පවුල්වලට නොහැකි බව අධ්‍යයනවලින් පෙනී යයි. අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි බලාත්මක කිරීම සඳහා පිහිටුවන ලද පාසල් යාම පිළිබඳ කමිටු හා පරීක්ෂා කිරීම පිළිබඳ කමිටු විසින් එම රෙගුලාසි ග්‍රාමීය ප්‍රදේශවල ඵලදායී අන්දමින් බලාත්මක නොකරනු ලබයි. පාසලේ හා එහි විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ ගුරුවරුන්ගේ ලාර්ථ සමාජ පර්යාපන්න භාවය එතරම් දුරට ප්‍රවර්ධනය කරන බවක් පෙනෙන්නට නැත. අධ්‍යාපනයට ප්‍රවේශවීමේදී සිංහල සහ ශ්‍රී ලංකා දෙමළ ජනයා අතර ස්ත්‍රී-පුරුෂ වෙනස්කම්

නොමැත. ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය කෙරෙහි ග්‍රාමීය මුස්ලිම් ප්‍රජාවන්ගේ නිෂේධාත්මක සමාජ-සංස්කෘතික ආකල්ප වෙනස් වෙමින් පවතී. අධ්‍යාපන කටයුතුවලට ප්‍රවේශවීම සම්බන්ධයෙන් වතුකරය තවමත් අවාසිදායක තත්ත්වයක පවතී; එහෙත් අතීතයේදී මෙම පවුල්වල ගැහැණු ළමයින් කොන් කරනු ලැබුවා වුව ද 1-5 දක්වා ශ්‍රේණිවල 48.2% ක් ද 6-8 දක්වා ශ්‍රේණිවල 48.6% ද 9-11 දක්වා ශ්‍රේණිවල 53.5% ක් ද ගැහැණු ළමයින් වූ බව 2001 පාසල් සංගණනයේදී දක්නට ලැබුණු හෙයින් ස්ත්‍රී-පුරුෂ සමාන භාවය අත්පත් කර ගෙන ඇති බව පෙනී ගොස් තිබේ.

අධ්‍යාපන ප්‍රතිපත්තියෙන් මුළුගැන්වී ඇති එමෙන්ම තම ජීවන අවස්ථා දියුණුවන ආකාරයේ අධ්‍යාපනයකට ඇති අයිතිවාසිකම් අහිමිවූ අන්තරාදායක තත්ත්වයේ ගැහැණු හා පිරිමි ළමයින් කණ්ඩායම් සෑම ප්‍රජාවකම සිටිති. මේ අතර පහත සඳහන් අය වෙති:

(i) ප්‍රධාන සමාජ ප්‍රවාහයෙන් බැහැරව ජීවත්වන වැදි ජනයාගේ සහ යටපත්වූ කුලවල ළමයි,

(ii) තදබල නොහැකියාවන් නොමැති ළමයි විධිමත් පාසල් අධ්‍යාපන වැඩසටහනට ඇතුළත් කිරීම සඳහා සිය ආධාර යටතේ පැවැති විශේෂ අධ්‍යාපන වැඩ සටහන අවසාන වීමත් සමග සිය තත්ත්වය පහළ වැටුණ සහ ආයතනික වශයෙන් රැක බලා ගැනීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිව සිටින ශාරීරික හා මානසික ආබාධවලින් පෙළෙන ළමයි,

(iii) දුප්පත් පවුල් විසින් ආර්ථික සම්පත් වශයෙන් සලකනු ලබන වැඩ කරන ළමයි; ඔවුන්ට අධ්‍යාපනයට ප්‍රවේශ වීම අහිමිකර ඇති අතර අවිධිමත් අංශයේ, ඇතැම්විට අන්තරාදායක කටයුතුවල සහ වානිජමය ලිංගික කටයුතු සහ හොර මත්පැන් හා මත්ද්‍රව්‍ය ප්‍රවාහනය වැනි, අන්තර්ජාතික කම්කරු සංවිධානය කියන පරිදි "ඉතාමත් නරක ආකාරයේ ළමා ශ්‍රමිකයන්" වශයෙන් යෙදී සිටිති.

(iv) ආයතනික හෝ පවුල්වල ආරක්ෂාව නොලබන අනාථ, අත්හැර දැමූ සහ අසරණ භාවයට පත්වී ඇති ළමයින්,

(v) රිමාන්ඩ් බන්ධනාගාරවල සහ රැඳවුම් මධ්‍යස්ථානවල සිටින ළමයින්,

(vi) තනිව හෝ තම පවුල් සමඟ ජීවත්වන එමෙන්ම ආර්ථික හා ලිංගික ආත්මාර්ථය පිණිස යොදාගැනීමට, මත්ද්‍රව්‍ය භාවිතයට හා අපරාධවලට යොමුවීමට ඉඩ ඇති වීථි ළමයි, සහ

(vii) අලුතෙන්ම ඇතිවී සිටින කණ්ඩායම් වන සන්නද්ධ ගැටුමට හසුවී අවතැන්ව තම නිවාසවල ජීවත්ව සිටින පවුල්වලට අයත් ළමයි. ඔවුනු උතුරේ සහ නැගෙනහිර දෙමළ හා මුස්ලිම් ප්‍රජාවන්ට ද පුත්තලම දිස්ත්‍රික්කයේ මුස්ලිම් පවුල්වලට ද උතුරු මැද හා ඌව පළාත්වල සිංහල පවුල්වලට ද අයත් වෙති. ඔවුන් පුනරුත්ථාපනය කිරීම සහ අධ්‍යාපනය ඇතුළු මූලික සේවාවලට ඔවුන්ට ප්‍රවේශයක් ඇති කිරීම හදිසි කාරණයකි.

අන්තරාදායක තත්ත්වයේ පසුවන මෙම කණ්ඩායම්වලට සියලු ප්‍රජාවන්ගේ ළමයි ඇතුළත් වෙති. එයින් ආර්ථික වශයෙන් වැඩියෙන්ම අවාසිදායක තත්ත්වයේ පසුවන්නේ සමාජ බැහැරකිරීමට ගොදුරුවූවෝ වෙති .

විශ්ව විද්‍යාල 13 ක් ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා උසස් අධ්‍යාපන මට්ටමේ දී අදාළ වයස කාණ්ඩයෙන් විශ්ව විද්‍යාලවල සිටින්නේ 2% - 3% අතර ප්‍රමාණයක් පමණි. අනිකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් සමඟ සසඳන විට මෙය ඉතාමත් අඩු ප්‍රමාණයකි. මෙම සීමිත අවස්ථාවන් ඇතුළත 1995-1996 තුළ ඇතුළත් කරනු ලැබූ අයගෙන් 49.8% ක් ද 1999-2000 තුළ ඇතුළත් කරනු ලැබූ අයගෙන් 51.7% ක් ද කාන්තාවෝ වූහ. ඉංජිනේරු විද්‍යා අංශය (14.6% ), ජේශකර්ම හා ඇඳුම් නිෂ්පාදන කර්මාන්තයට අදාළ පාඨමාලා (16.7%), පරිගණක විද්‍යාව (18.3%) ප්‍රමාණ පරීක්ෂණය (23.3%), භෞතික විද්‍යාව (24.4%) සහ ව්‍යවහාර විද්‍යාව (36.9%) යන අංශවල ශිෂ්‍යාවන්ගේ ඌන නියෝජනයක් පැවතුනි. උසස් පෙළ විද්‍යා ධාරාවට ඇතුළත්වීම් මගින් පෙන්නුම් කරන පරිදි මෙම සියලු අංශ "පුරුෂ පක්ෂයේ විශිෂ්ටත්වයක් ඇති" ක්ෂේත්‍ර ලෙස දක්නා ලදී. නීති අධ්‍යාපන පීඨවල (78.8%) සහ කලා පීඨවල (71.6%) ඔවුනු අධි නියෝජනයක් දරති.

විශ්ව විද්‍යාල අධ්‍යාපනයට ප්‍රවේශ වීමේදී වැඩියෙන්ම අවාසි තත්ත්වයකට පත්ව සිටින්නේ ශ්‍රී ලංකාවේ සුළුතර ජන කොටස් සහ මෑත කාලයේ ඉන්දියානු ප්‍රභවයක් ඇති දෙමළ ජනතාව. මක්නිසාදයත් ද්විතීයික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ දී ඔවුන්ට බාධක තිබෙන හෙයිනි. 1995-1996 දී විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගන්නා ලද අය අතුරින් 77.6% සිංහල ද, 17.02% ක් දෙමළ ද, 5.1% ශ්‍රී

ලංකා යෝනක ද 0.2% ක් ''වෙනත් අය'' ද (නිදසුනක් වශයෙන් බර්ගර් සහ මැලේ ) වූහ. ජීව විද්‍යාව, වෛද්‍ය විද්‍යාවට සම්බන්ධ පාඨමාලා, කෘෂිකර්මය සහ ගෘහ නිර්මාණ ශිල්පය යන අංශවල සිංහල ශිෂ්‍යන්ගේ අධි නියෝජනයක් පැවතුනි. ශ්‍රී ලංකා දෙමළ ශිෂ්‍යයන්ට ඉංජිනේරු සහ ප්‍රමාණ පරීක්ෂණ අංශවල අධි නියෝජනයක් තිබූ අතර නීතිය සහ ගෘහ නිර්මාණ ශිල්පය යන අංශවල බෙහෙවින් අඩු නියෝජනයක් පැවතුණි. ශ්‍රී ලංකා යෝනක ශිෂ්‍යයෝ නීතිය හැර සෙසු සියලු පාඨමාලාවල ඌන නියෝජනයක් දැරූහ. ඉන්දියානු දෙමළ ජනයා තවදුරටත් වෙනම වර්ගයක් ලෙස ''ගණන් ගනු'' නොලැබේ. ප්‍රමාණය අතින් ඔවුන් ඉතා අඩු හෙයින් හමුවන්නේ කලාතුරකිනි. මෙම වෙනස්කම් ඇතිවන්නේ ද්විතීය අධ්‍යාපනයට ලියාපදිංචි වන ප්‍රමාණවල වෙනස්කම් මෙන්ම විශ්ව විද්‍යාලවලට ඇතුළත් කිරීම සඳහා 1970 ගණන්වල මුල් භාගයේදී ඇතිකළ දිස්ත්‍රික් පංගු ක්‍රමය ද නිසාය. පංගු ක්‍රමයට ජනගහනය පදනම් වී ඇති අතර, එයින් අධ්‍යාපනය අතින් අවාසිදායක තත්ත්වයක පවතින දිස්ත්‍රික්කවල ශිෂ්‍යයන්ට සහාය දීමට අදහස් කරන ලදී. එහෙත් අනිකුත් දිස්ත්‍රික්කවල වඩා උසස් මට්ටමක් ලබා ඇති ශිෂ්‍යයන්ට එය අවාසිදායක ලෙස බලපායි. යාපනය සහ කොළඹ දිස්ත්‍රික්කවල විශ්ව විද්‍යාල අධ්‍යාපනයට ඇතිවූ සීමා කිරීම් නිසා ජනවාර්ගික ආතති අධික වූ අතර, සියලු ප්‍රජා කොට්ඨාසවල වෘත්තිය පවුල්වල ළමයින් විදේශ රටවලට යෑම වැඩිවිය. විවිධ මට්ටම්වල දී පාසල් අධ්‍යාපනය හැරයන ළමයින්ගේ අවශ්‍යතා සපුරාලීමට රජයේ කාර්මික-වෘත්තිය අධ්‍යාපන පහසුකම් ප්‍රමාණවත් නොමැති බැවින් ඒ කාරණය පුද්ගලික අංශයේ වැඩසටහන්වලට බැඳීමට නොහැකි දුප්පත් පවුල්වල නිපුණතා වර්ධනය සඳහා ඇති අවස්ථා කෙරෙහි අයහපත් බලපෑමක් ඇති කරයි. කාර්මික විද්‍යාල, වෘත්තිය පුහුණු අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය සහ ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව වැනි රජයේ නියෝජිත ආයතන විසින් දිවයින පුරා සංවිධානය කර ඇති සියලු ආයතනවල ස්ත්‍රී-පුරුෂ අසංතුලනයක් ඉතා පුළුල් ලෙස පවතී. ඊට හේතුව සම්ප්‍රදායික ''කාන්තා''පාඨමාලාවලට කාන්තාවන් ගොනුවීමේ නැඹුරුවක් සහ කාර්මික අංශ ආශ්‍රිත පාඨමාලාවල කාන්තාවන්ගේ ඌන නියෝජනයක් තිබීමයි.

## කාර්ය සාධනය

සාපේක්ෂ වශයෙන් උසස් සාක්ෂරතාවක් සංගණන සමීක්ෂණ මගින් හෙළිවීමෙන් පෙනී යන්නේ අඩුතරමින් ප්‍රාථමික අධ්‍යාපනයටවත් ප්‍රවේශයක් ඇති බවකි. (1996-1997) මහ බැංකුව විසින් පවත්වන ලද පාරිභෝගික මූල්‍ය සහ සමාජ-ආර්ථික

සමීක්ෂණය වාර්තා කළේ (උතුර හා නැගෙනහිර හැර) පිරිමින්ගෙන් 94.3% කට සහ කාන්තාවන්ගෙන් 89.4% කට සාක්ෂර භාවය තිබෙන බවයි. මෙය නාගරික අංශයේ පිළිවෙළින් 96.1% ක් සහ 93.0% ක් ද ග්‍රාමීය අංශයේ පිළිවෙළින් 94.5% සහ 90.0% ක් ද, වතු අංශයේ පිළිවෙළින් 87.2% ක් හා 67.3% ක් ද විය. වතු අංශයේ සාක්ෂරතා මට්ටම මෑත වර්ෂවලදී දියුණුවී ඇතත් එම අංශය පැහැදිලි වශයෙන්ම ඉතාමත් අවාසිදායක තත්ත්වයේ පවතී. පාසැල් යන වයසේ ජනතාව අතර ස්ත්‍රී-පුරුෂ භේදමය වෙනස්කම් ඇත්තෙම නැති තරම්ය. අවුරුදු 10-19 වයස් කාණ්ඩයේ පිරිමි සහ ස්ත්‍රී සාක්ෂරතාවය 95% යි. එසේ වුව ද සාර්ව අධ්‍යයන සහ වතුකරයේ පවුල් පිළිබඳ සංඛ්‍යානවලින් පෙනීයන පරිදි පාසැල්වලට ඇතුළත්වීම් සම්බන්ධයෙන් පවතින වෙනස්කම් නිසා අවාසිදායක තත්ත්වයේ පවතින පවුල්වල කාන්තාවන් සහ ළමයින් අතර සාක්ෂරතාවය නොමැති කණ්ඩායම් බිහිවී තිබේ. ප්‍රාථමික පාසැල් මට්ටමේ හැකියාවන් සහ ද්විතීය පාසැල්වල සහ විශ්ව විද්‍යාලවල ප්‍රසිද්ධ විභාග සඳහා ඇතුළත්වීමේ හැකියාවන්හි සාධන මට්ටම්වල ස්ත්‍රී-පුරුෂ භේද වෙනස්කම් ඉතා අඩුය, එසේ නැත්නම් ඇත්තෙම නැත. එහෙත් සාධනයේ සහ විශිෂ්ටතා මට්ටම්වල අන්තර්-දිස්ත්‍රික්ක වෙනස්කම් ඇති බව පෙනී ගොස් තිබේ. ආර්ථික වශයෙන් සහ අධ්‍යාපනික වශයෙන් ඉතාමත් අවාසිදායක තත්ත්වයේ පවතින මොනරාගල දිස්ත්‍රික්කය සහ වතුකර ජනතාවෙන් 50% සිටින නුවරඑළිය දිස්ත්‍රික්කය සන්තතියේ එක් කොණක ද කොළඹ සහ ගම්පහ අනෙක් කොණේ ද පවතී. දැනට දෙමළ මාධ්‍යයෙන් සුදුසුකම් ලත් ගුරුවරුන් සේවයේ යොදවා ඇති ආකාරයේ ද විෂමතාවක් පවතී. සමාජ ආර්ථික පසුබිම, පාසැල් පහසුකම්වල තත්ත්වය සහ පාසැල් කාර්ය සාධනයේ සම්බන්ධතාවක් පවතින බව පැහැදිලිය.

## අධ්‍යාපනය, ජනවාර්ගික සුසංයෝගය සහ ස්ත්‍රී-පුරුෂ සමාන භාවය තුළින් සමාජානුයුක්ත භාවය ඇති කිරීම

අධ්‍යාපනික අවස්ථා පුළුල් කිරීමට ප්‍රතිපත්ති මගින් අපේක්ෂා කර ඇති නමුදු, ජනවාර්ගික ගැටුමෙන් විනාශවී ඇති බහු-වාර්ගික, බහු-ආගමික රටේ ජාතික සුසංයෝගය ප්‍රවර්ධනය කිරීමට අධ්‍යාපනික ක්‍රියාවලි පාවිච්චි කිරීමට සම්ගාමී උත්සාහයන් දරා නොමැත. අධ්‍යාපන මෙවලම්වල ජන වාර්ගිකමය ඒකාකෘති බිහි කිරීම, එසේම විවිධ ප්‍රජා කොට්ඨාසවලට හා ආගම්වලට අයත් ළමයින් අතර අන්‍යොන්‍ය අවබෝධය හා අනිත් සංස්කෘතීන්වලට ගෞරවය හා සරුබවින් යුත් විවිධත්වය පිළිගැනීම ප්‍රවර්ධනය කිරීමට විෂය මාලා සංවර්ධනය කිරීමට හා පාඨම් පොත් නිෂ්පාදනය කිරීමට අපොහොසත් වීම නිසා,

නොඉවසීම, අසමඟිය හා ගැටුම් වර්ධනය වී තිබේ. ගැටුම් විසඳීම පහසු කිරීම පිණිස වැඩසටහන් ඉදිරිපත් කර තිබේ; එහෙත් යථාත්මක ආකල්ප සහ අන්තර්-පුද්ගල සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම තුළින් එවැනි ගැටුම් වැළැක්වීම පිළිබඳ කාරණයට ප්‍රමාණවත් අවධානයක් කිසිවිටකත් යොමු වී නැත. මිශ්‍ර ජනතාවන්ට අයත් සිසුන් සහ භාෂා මාධ්‍ය දෙකක් ඇති පාසැල්වල ශිෂ්‍යයෝ සිය බුද්ධිමය, සමාජ හා සංස්කෘතික අන්තර් ක්‍රියාවලදී බොහෝදුරට තම ප්‍රජා කොට්ඨාසවලට පමණක් ගොනුවී සිටීමේ ස්වභාවයක් පෙන්නුම් කරති.

ව්‍යාප්තිමය නැමියාවක් සහිත විෂයමාලාවල ස්ත්‍රී-පුරුෂ වශයෙන් බෙදා වෙන්කිරීමක් පැවතීම, අධ්‍යාපන මෙවලම්වල ස්ත්‍රී-පුරුෂ භූමිකා පිළිබඳ ඒකාකාරී සිතීම සහ පිරිමි ළමයින් හා ගැහැණු ළමයින් අතර වෙන් වෙන් වශයෙන් වූ හැසිරීම් රටා බලාපොරොත්තුවීම නිසා අධ්‍යාපන ක්‍රියාවලියේ සමාජානුයෝජන භාවය විසින් නිශේධක ස්ත්‍රී-පුරුෂ භේද ප්‍රතිමාන දැරගන්වනු ලැබ තිබෙන හෙයින් කාන්තාවන් බල ගැන්වීමට අධ්‍යාපනය අසමත්වී තිබේ. සියලුම ගැහැණු ළමයින් මෙම ප්‍රතිමාන සහ අපේක්ෂාවලට අනුකූල නොවන අතර ස්ත්‍රී-පුරුෂ වශයෙන් බෙදා ඇති විෂයමාලාව සහ "සැඟවුන විෂය මාලාව" නිසා ගැහැණු ළමයින්ගේ අපේක්ෂා මට්ටම අඩු කිරීමේ හෝ කලින් සඳහන් කළ ස්ත්‍රී-පුරුෂ අසාධාරණ මගින් දක්නට ලැබුණු පරිදි උසස් හා වෘත්තීය අධ්‍යාපන විකල්ප තෝරා ගැනීමේදී ඔවුන්ට බලපෑමක් ඇතිකිරීමේ නැඹුරුවක් දක්නට තිබේ. පුරුෂාධිපත්‍යය සහ කාන්තාවන් ඊට අවනත වීම වර්ධනය කරන්නාවූ පීඩාකාර ප්‍රතිමාන සහ දායාද ක්‍රමය, කන්‍යාභාවය පරීක්ෂා කිරීම සහ ස්ත්‍රී-පුරුෂ භාවය පදනම්වූ ප්‍රචණ්ඩත්වය වැනි සමාජ භාවිතවලට අභියෝග කිරීම සඳහා කාන්තාවන් සූදානම් කිරීමට පාසල් හා විශ්ව විද්‍යාල මට්ටමේ අධ්‍යාපනය අපොහොසත් වී ඇති බවක් පෙනී යයි. නව විෂයමාලාවට ජීවන කුසලතා විෂය ඇතුළත් කරන ලද්දේ, වෙනත් කටයුතු අතර, ජාතික සමගිය සහ ස්ත්‍රී-පුරුෂ සමාන භාවය ප්‍රවර්ධනය කිරීමටයි. මෙම සංකල්ප සියලු විෂයමාලාවලට සහ විෂයානුබද්ධ ක්‍රියාකාරකම්වලට අන්තර්ගත කිරීම අවශ්‍ය හෙයින් මෙහි අරමුණු "විෂයයක්" විසින් අත්කර ගනු ඇතැයි සිතිය නොහැක.

## ආරක්ෂිත වාතාවරණයක්

ළමයාගේ අයිතිවාසිකම්වලින් එකක් වන්නේ ආත්මාර්ථය පිණිස යොදා ගැනීමෙන් සහ අපයෝජනයෙන් බේරී සිටීමයි. සියලුම ළමයින්ට පාසැල ආරක්ෂිත වාතාවරණයක් සපයන්නේ ද යන්න තර්කයට භාජනය වූ කරුණකි. ශාරීරික දඬුවම් පැමිණවීම තහනම් කරමින් අධ්‍යාපන අමාත්‍යාංශයෙන්

චක්‍රලේඛයක් යවා ඇති නමුදු කඳබල දඬුවම්වලට ළමයි ගොදුරු වෙති. ඇතැම් විට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට ද අවශ්‍ය වෙයි. විශේෂයෙන් පාසැල්වල ළමා අපයෝජනය සහ ලිංගික අපයෝජනය සැඟවී තිබූ කාරණයක් වුව ද මෑත වර්ෂවල දී එහි දර්ශනය වැඩිවී තිබේ. අපයෝජනය සිදු කරන්නන් අධ්‍යාපනඥයන් වීම නිසා ටට ගොදුරු වන්නන්ගේ අසරණ භාවය වැඩිවී තිබේ.

## මැදිහත්වීම්

සුළුතර කොටස් ගැන සලකන විට

- උතුරේ සහ නැගෙනහිර අධ්‍යාපන පහසුකම් ප්‍රනරුත්ථාපනය කිරීම අවශ්‍ය වෙයි,
- ජාතික අධ්‍යාපන ක්‍රමයේ අන්තර්ගත කොටසක් වශයෙන් වතුකරයේ පාසල්වලට දිගටම උපකාර ලබාදීමේ අවශ්‍යතාවයක් පවතී, එමෙන්ම
- වැදි ජනයාගේ සහ යටපත් වී සිටින ප්‍රජාවන්ට අයත් ළමයින් අධ්‍යාපනයට ප්‍රවිෂ්ටවීමේ අවශ්‍යතාවක් තිබේ.

අධ්‍යාපනය ලැබීමට සියලු ළමයින්ට ඇති අයිතිවාසිකම් පහත සඳහන් පරිදි සහතික කළ යුතුය:

- අධ්‍යාපනය අනිවාර්ය කර තිබෙන නීති බලාත්මක කරන ලෙස රජය, ප්‍රාදේශීය අධ්‍යාපන පරිපාලකයන්, අනිවාර්ය අධ්‍යාපන කමිටු උනන්දු කිරීම සහ අන්තරාදායක තත්ත්වයේ සිටින කණ්ඩායම්වල අය ඇතුළු සියලු ළමයින් අධ්‍යාපනය ක්‍රමය අලුට ගෙන ඒම පිණිස අවිධිමත් කේන්ද්‍ර ශක්තිමත් කිරීම,
- පාසැල්වලට ඇතුළත් කිරීම සඳහා දුප්පත් ළමයින්ට උපකාර කරන ලෙසටත්, ළමා අපයෝජනවලින් ළමයින් ආරක්ෂා කිරීම සහතික කිරීමට ප්‍රාදේශීය නිලධාරීන්ට, විදුහල්පතිවරුන්ට සහ ගුරුවරුන්ට ළමා අයිතිවාසිකම් වැඩසටහන් සංවිධානය කිරීමටත් රාජ්‍ය සහ රාජ්‍යයෙන් පිට නියෝජිත ආයතනවලට සහ රාජ්‍ය නොවන සංවිධානවලට බලකර කියා සිටීම,
- ප්‍රාදේශීය-නවෝදය පාසල් සංවර්ධනය වේගවත් කිරීමට සහ සියලු දෙනාටම "විද්‍යාව හා තාක්ෂණය" කරා ප්‍රවේශවීම ප්‍රවර්ධනය කිරීමට රජයට ආධාර කිරීම,

- අධ්‍යාපනයේ තත්ත්වය සහතික කිරීමට සහ ළමයාගේ පූර්ණ සංවර්ධනය සහතික කිරීමට සහ ජනවාර්ගික සහ ස්ත්‍රී-පුරුෂ භූමිකා පිළිබඳ ඒකාකෘති ඉවත් කොට ජාතික සමගිය, බහුවිධ සංස්කෘතික වාදය සහ ස්ත්‍රී-පුරුෂ සමාන භාවය ප්‍රවර්ධනය කරන මෙවලම් හඳුන්වා දීම;
- ජනවාර්ගික සහ සමාජ-ආර්ථික දුර්වල කොටස්වල අවශ්‍යතා සපුරාලීම පිණිස සම්පත් වෙන්කිරීමේදී "ධනාත්මක ලෙස වෙනස්කම්වලට භාජනය කිරීම" ඉල්ලා සිටීම.

## රැකියා නියුක්තිය

ශතවර්ෂගණනාවක කාලයක සිටම ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රජා කොට්ඨාසවල කාන්තාවෝ ආර්ථික නිෂ්පාදිකාවන් වූහ. 1980 ගණන් වන තෙක්ම ජාතික සමීක්ෂණ අනුව කාන්තාවන් රැකියා ව්‍යුහයේ සියලුම මට්ටම්වල ශ්‍රම බලකායට සහභාගිවීමේ අනුපාතිකයන් වැඩිවී තිබේ. එය 1990 මුල් කාලයේදී අඩුවී නැවතත් වැඩි විය. එහෙත් කාන්තාවන් සැලකෙන ප්‍රමාණයක් නිරතව සිටින්නේ අවිධිමත් අංශය තුළයි. ඒ තුළ ඔවුන්ගේ ශ්‍රමය අඩු තක්සේරුවකට භාජනය වී හෝ තක්සේරුවකට භාජනය නොවී පවතී. රැකියා නියුක්තියේ වෙනස්වන නැඹුරුවීම් සමග ආර්ථිකයට සහ ජාතික ආදායමට වැදගත් දායකත්වයක් ඔවුන් විසින් දිගටම ලබා දෙනු ලැබේ. ප්‍රධාන වශයෙන් ඇඟලුම් සේවිකාවන් සංක්‍රමණික ගෘහ සේවිකාවන් සහ වතුකරයේ කම්කරු කාන්තාවන් වශයෙන් ඔවුන්ගේ දායකත්වය ලැබේ. ගුරුවරියන්, හෙදියන්, ගෘහ සේවිකාවන්, දේශීය කෘෂිකර්මාන්තයේ සේවා, දේශීය කුඩා කර්මාන්තවල සහ නාගරික අඩු ආදායම් අවිධිමත් අංශය යන මේවායේ කාන්තාවෝ ඒකරාශීවී සිටිති. බහුතර සහ සුළුතර ප්‍රජා කොටස්වල කාන්තාවෝ එවැනි ආර්ථික ක්‍රියාකාරකම්වල නිරතව සිටිති. බොහෝදුරට අපනයන සැකසුම් කලාප බස්නාහිර හා දකුණු පළාත් තුළ පිහිටුවීමත් ජනවාර්ගික ගැටුම් නිසා උතුරු හා නැගෙනහිර ග්‍රාමීය ඇඟලුම් කර්මාන්ත ප්‍රචලිතවීම වැළැක්වීමත් නිසා ඇඟලුම් සේවිකාවන් වශයෙන් සුළුතර කොටස්වල කාන්තාවන් සිටින්නේ සාපේක්ෂ වශයෙන් සුළු ප්‍රමාණයකි. බටහිර ආසියානු රටවල ආගම් සහ සංස්කෘතිය සමග පවතින තමන්ගේ ආගමික හා සංස්කෘතික සම්බන්ධතා හේතුවෙන් සංක්‍රමණික සේවිකාවන් අතර මුස්ලිම් කාන්තාවෝ අධිනියෝජනයක් ලබා සිටිති.

19 වන ශතවර්ෂයේදී බ්‍රිතාන්‍ය යටත් විජිත පරිපාලනය විසින් ඇති කරන ලද වතුකර දෙමළ ප්‍රජාවේ කම්කරු ශ්‍රම බලකායෙන් අඩක් කාන්තාවෝ වූහ. එහෙත් 1948 වන තුරුම ඔවුන්ට ගෙවන ලද්දේ අසමාන වැටුප් ප්‍රමාණයන් ය. පුද්ගලික අයිතියෙන් රජයේ අයිතියට 1992ට පසුව පුද්ගලික අංශයේ කළමනාකරණයට හා වැඩි වැඩියෙන් පුද්ගලික අයිතියට ද මාරුවීම තුළින් වතු අංශය පශ්චාත්-ස්වාධීන ශ්‍රී ලංකාව තුළ වෙනස්වීම් පිළිබඳ සම්පූර්ණ චක්‍රයක් අවසන් කළේය. කාන්තා ශ්‍රමය සඳහා තිබූ ඉල්ලීම අඩුවී නැත. එහෙත් පෙර දශකවල තිබූ රැකියා සුරක්ෂිතභාවය අනුව සලකන විට අනියම් භාවය වැඩිවී ඇත. තවද වැඩිවන අධ්‍යාපනික අවස්ථාවන් එක්කම රැකියා සෙවීම පිණිස තරුණ කාන්තාවෝ වතුකරයෙන් පිටව යති. ඉතාමත් "පහළම කොටස්"- වැඩි දෙනා සහ යටපත්වී සිටින කුලවතුන්ගේ සම්ප්‍රදායික රැකියාවල යෙදී සිටිති.

1970 ගණන්වල සහ 1980 ගණන්වල විරැකියාව පිළිබඳ නිල අනුපාතිකයන් ඉහළ ගොස් තිබී ඇත. වර්තමානයේදී පහත වැටී තිබෙන නමුදු කාන්තාවන්ගේ විරැකියාව පිළිබඳ අනුපාතිකයන් පිරිමින්ගේ විරැකියා අනුපාතිකයන් මෙන් දෙගුණයක් වන සේයින් රැකියාවලට ප්‍රවේශවීමේදී ඔවුන්ට පැහැදිලිවම අවාසිදායක තත්ත්වයක් ඇතිවී තිබෙන බැව් පෙනේ. පසුගිය වර්ෂවල පුරුෂ ශ්‍රමය යොදා ගැනීමේ වඩා සාපේක්ෂ වශයෙන් ස්ථායි තත්ත්වයක පැවත ඇති අතර කාන්තාවන්ගේ ශ්‍රමයේ අනියම් භාවයට නැඹුරුවීමක් තිබී ඇත. තවද, වැටුප් නොගෙවන පවුල් කටයුතුවල ශ්‍රමිකයන් වශයෙන් කාන්තාවන් නිරතවීමේ සීඝ්‍ර වැඩිවීමක් ද ඇති වී තිබේ. ශ්‍රම වෙළඳපල ස්ත්‍රී-පුරුෂ භේදය අනුව බෙදීම සහ තීරණ ගැනීමේ උසස් තත්ත්වය දක්වා රැකියාවේ ඉහළට යාමේ සීමා කෙරෙන "වීදුරු සිවිලිම" වෙනස්වී ඇත්තේ ඉතාමත් අල්ප වශයෙනි. නිල සංඛ්‍යා ලේඛන අනුව ළමා ශ්‍රමය පිළිබඳ කාරණය පහත් තත්ත්වයක (3%ක් පමණ) පවතී; එහෙත් ඊට වඩා වැඩි ළමයින් ප්‍රමාණයක් වැටුප් ලබන ශ්‍රමිකයන් වශයෙන් සහ පවුල්වල ශ්‍රමිකයන් වශයෙන් යෙදී සිටින බව සූක්ෂම අධ්‍යයනයන් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාවේ (1978) ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ස්ත්‍රී-පුරුෂ සමාන භාවය සහතික කරයි; එහෙත් රැකියා නියුක්තියේ දී වෙනස්කම්වලට භාජනය නොකිරීම පිළිබඳ එහි විධිවිධාන රාජ්‍ය අංශයට පමණක් සීමාවී තිබෙන අතර ඒ අනුව කාන්තා ශ්‍රමිකයන්ගෙන් වැඩි පිරිසක් අනාරක්ෂිත තත්ත්වයේ සිටිති. එක්සත් ජාතීන්ගේ සම්මුති මඟින් අන්තර්ජාතික ප්‍රතිමාන පනවා ඇත. ශ්‍රී ලංකාව අනුමත කර ඇති කාන්තා සම්මුතිය, ඇතැම් ඒවා ශ්‍රී ලංකාව විසින් සහතික කර ඇති සහ ජාතික

කම්කරු නීතිවලට ඇතුළත් කර ඇති අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුති සහ (1983) කාන්තා ප්‍රඥප්තිය මගින් මෙම ප්‍රතිමාන දේශීය වාතාවරණයට ඇතුළත් කර ඇත. කෙසේ වෙතත් ක්‍රියාත්මක අතින් බලන විට නීති සහ රෙගුලාසි පැහැදිලි ලෙස උල්ලංඝනය වීම් පවතී.

“සියලු මිනිසුන්ගේ අහිමි කළ නොහැකි අයිතියක්” වශයෙන් කාන්තා සම්මුතියේ දක්වා ඇති සහ “මූල්‍ය ප්‍රතිලාභ සඳහා ආර්ථික ක්‍රියාකාරකම්වල යෙදීමට” සියලු කාන්තාවන්ට සහ පිරිමින්ට ඇති සමාන අයිතියක් බවට කාන්තා ප්‍රඥප්තියේ අර්ථ දක්වා ඇති වැඩ කිරීමේ අයිතිය සාපේක්ෂ වශයෙන් එක තැන පල්වන ආර්ථිකයක පවතින පහත් තත්ත්වයේ උපයා ගැනීමේ ධාරිතාවය සහ කාන්තාවන්ගේ ප්‍රජනන භූමිකා සංදර්භය තුළ බොහෝ පවුල් විසින් පනවා ඇති ප්‍රතිමානක තහංචි ද නිසා අවහිර කරනු ලැබ තිබේ. වැඩ කිරීමේ අයිතිය ළමයින්ට දීර්ඝ නොවන අතර අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුති මගින් රැකියා නියුක්තිය සඳහා අවුරුදු 15 ක අවම වයස පනවා තිබේ. 1999 වර්ෂයේ අවුරුදු 15 ක අවම වයසක් පැනවීම සඳහා කම්කරු නීති රීති සංශෝධනය කරන තුරු රැකියා නියුක්තිය සඳහා පැහැදිලි අවම වයසක් ශ්‍රී ලංකාවේ නොවීය. විධිමත් අංශයෙන් බැහැරව වන අංශයේ ද මෙම වෙනස්කිරීම පිළිබඳ අවබෝධය සීමා සහිත වන අතර සියලු ප්‍රජා කොට්ඨාසවලට අයත් දුප්පත් පවුල් විසින් තම ආදායම් වැඩි කර ගැනීම සඳහා තවමත් ළමයින් යොදා ගනු ලැබේ.

රැකියාවලට බඳවා ගැනීම්, ස්ථානගත කිරීම, උසස් කිරීම, සේවා කොන්දේසි සහ රැකියා සුරක්ෂිත භාවය යන කරුණු අතින් රැකියා නියුක්තියේ දී වෙනස්කම්වලට භාජනය නොකිරීම සම්මුති සහ කාන්තා ප්‍රඥප්තිය මගින් අවධාරණය කර තිබේ. වතුකරයේ කාන්තාවන් ඇතුළු කාන්තා ශ්‍රමිකයන් සම්බන්ධයෙන් මෙම අවශ්‍යතා පිළිපැදීමට වඩා ඒවා උල්ලංඝනය කිරීම අධික බවට ප්‍රත්‍යක්ෂ අධ්‍යයන මගින් ප්‍රමාණවත් සාක්ෂි ලැබී තිබේ. කර්මාන්ත ශාලාවල වියදම් අඩු කිරීම සඳහා අඩු වියදම් ශ්‍රමය වශයෙන් හැර කාන්තාවන් බඳවා ගැනීමටත් “පුරුෂ” සහ “ස්ත්‍රී” යනුවෙන් වෙන්වූ ඒකාකාතික පදනමෙන් වන රැකියා ක්ෂේත්‍රවලට අයත් සම්ප්‍රදායික නොවන කාර්මික රැකියාවල ඔවුන් යෙදවීමටත් හාම්පුතුන් කැමති නැත. කාන්තාවන් කළමනාකරුවන් වශයෙන් පත් නොකිරීමට ද එවැනි තනතුරුවලට ඔවුන් උසස් නොකිරීමට ද හාම්පුතුන් ප්‍රවණතා දක්වති. මෙය ද පුරුෂ නායකත්වයේ දේවත්ව අයිතිය පිළිබඳ සංජානනය මත සිදුවන්නකි. දශක ගණනාවක සිට සමාන වැටුප් යන්න උසස් හා මධ්‍ය මට්ටමේ රැකියා නියුක්තියේ මූලධර්මයකි. එසේ වුව තවමත් දුම්කොළ සහ

කුරුඳු කර්මාන්තය හැර වතු අංශයේ පුහුණු හා නොපුහුණු ශ්‍රම ක්ෂේත්‍රවල පඩිපාලක සභා මඟින් හඳුන්වා දෙන ලද්දේ මෑතකදීය. කර්මාන්තවල හා වතු කර්මාන්තවල සේවා පැය අධික වුවද (ක්‍රියාත්මක වශයෙන් අනිවාර්ය වීමේ ප්‍රවණතාවක් ඇති ) අතිකාල පුළුල් කර ඇත්තේ මෑතකදීය. රාත්‍රී වැඩ තහනම් කර ඇති අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුතිවලින් ශ්‍රී ලංකාව 1984 දී ඉවත් විය. මේ අවස්ථා දෙකම "යහපත්" සේවා පහසුකම් සඳහා සේවකයන්ට ඇති අයිතිය ගැන නොතකා හාම්පුතුන්ගේ අවශ්‍යතා සපුරාලීමට කටයුතු කර තිබේ.

විධිමත් අංශයේ මාතෘ නිවාඩු සහ ප්‍රතිලාභ ක්‍රියාත්මක වන්නේ කම්කරු රෙගුලාසි මඟිනි. එහෙත් වැටුප් සහිත නිවාඩු දින 84 සහ කිරි දීම සඳහා සේවා කැඩීම් සහ දෙකටම හාම්පුතුන් විරෝධය පාන අතර මව් පිය නිවාඩුව ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගැනී නැත. දේශීය කම්කරු නීතිය තුළ ළමා සුරැකුම් සේවා ගැන සඳහනක් නොමැත.

වෘත්තිමය සෞඛ්‍ය සේවා සහ උපදෙස් සඳහා දී ඇත්තේ අඩු ප්‍රමුඛතාවක් වන අතර මේ කාරණය සම්බන්ධයෙන් වන අන්තර්ජාතික කම්කරු සම්මුතිය ශ්‍රී ලංකාව විසින් අනුමත කර නැත. කම්කරු රෙගුලාසි මඟින් නියමකොට ඇති වන්දි ලබාගැනීමට බල රහිත සේවකයන්ට ප්‍රවේශයක් නොමැත. කොන්ත්‍රාත් ක්‍රමයට සහ අනියම් පදනමෙන් රැකියා දීම, උප කොන්ත්‍රාත් පදනමෙන් බඳවාගත් සේවකයන් සහිත පර්යන්ත ශ්‍රම වෙළඳපලක් පුළුල් වීම සහ දැනුම් දීමක් නොකර කර්මාන්ත ශාලා වසා දැමීමට හැකිවීම සඳහා බැඳීම්වලට යටත් නැති කර්මාන්ත සංවිධානය කිරීමට බහුජාතික සමාගම්වල නැඹුරුව නිසා සේවකයන් බහුතරයකට රැකියා සුරක්ෂිතභාවය නොමැත. වාර්තා කරනු ලබන හා නොලබන ලිංගික අතවර වැඩකරන ස්ථානයේ බොහෝය. එහෙත් දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන පුළුල් අන්දමින් ක්‍රියාත්මක නොවේ. සේවකයන් ලිංගික අතවරවලින් ආරක්ෂා කිරීමට අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුති ද නැත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා අන්තර්ජාතික සම්මුතිවල ද සමාගම් පැවැත්වීමේ නිදහස ඇතුළත් කර තිබේ. එහෙත් අපනයන සැකසුම් කලාපවල වෘත්තිය සමිති පැවැත්වීමට අවස්ථාව ලැබී නැති අතර, වෘත්තිය සමිතිවල තීරණ ගැනීමේ දී කාන්තාවන්ට ඇත්තේ අඩු නියෝජනයකි. නිදසුනක් වශයෙන් සියලු වතු කම්කරු සේවකයන් බලසම්පන්න වෘත්තිය සමිතිවල සාමාජිකයන්ය; එහෙත් වැඩි පිරිසකට වෘත්තිය සමිතිවල කාර්යභාරය ගැන දැනීමක් නොමැති බව පෙනී

ගොස් තිබේ. ඉතාමත් වැදගත් කාරණයක් නම් අවිධිමත් අංශයේ කාන්තා ශ්‍රමිකයන් කම්කරු නීතියෙන් පිටත සිටීමත් සේවිකාවන් වශයෙන් ඔවුන්ට අයිතිවාසිකම් නොමැතිවීමත්ය. රජයෙන් ඉඩම් ලබා දී ඇති ජනපදවල (1935) ඉඩම් සංවර්ධන ආඥා පනත අනුව පොස්තමේන්තු රහිත අනුප්‍රාප්තියට සම්බන්ධ උපලේඛනය මගින් කාන්තාවන්ට වඩා පිරිමින්ට වැඩි සැලකිල්ලක් දක්වන්නාවූ ප්‍රථමජන්මාධිකාරය පිළිබඳ මූලධර්මය භාවිතය ඉදිරිපත් කරන හෙයින් කාන්තාවන්ට තම ඉඩම් අයිතිවාසිකම් අහිමිවී ඇත. ණය සඳහා ප්‍රවේශය තිබෙන නමුදු දුප්පතුන්ට, විශේෂයෙන්ම දුප්පත් කාන්තාවන්ට, ණය දීම සාර්ථකයක් ලෙස සැකීමට නැඹුරුවක් පවතී. තාක්ෂණය පාවිච්චි කිරීමට කාන්තාවන්ට හැකියාවක් නොමැති සේ සලකන හෙයින් කාන්තාවන්ගේ ප්‍රවේශය සීමිතය. වැඩි දෙනෙක් කාන්තා ගෘහ සේවිකාවන් වන සංක්‍රමික සේවකයන්ට ශ්‍රම වෙළඳපොළේ අනුකම්පාවන් මත විශ්වාසය තැබීමට සිදුවූ හෙයින් 1990 මැද භාගයේ ඔවුන්ගේ සේවා තත්ත්වයන් සහ ජීවන තත්ත්වය දියුණු කිරීමට ප්‍රතිපත්ති හඳුන්වා දෙන තුරුම දඬුවම් විරහිත ආර්ථික හා ලිංගික වශයෙන් ආත්මාර්ථය පිණිස යොදා ගැනීමට ගොදුරුවීමට ඔවුනට සිදුවිය. සංක්‍රමික සේවකයන් සහ ඔවුන්ගේ පවුල් ආරක්ෂා කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය 1996 දී අත්සන් කළාය. එහෙත් සංක්‍රමික සේවකයන් පිළිබඳ අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුති තවමත් අත්සන් කර නැත. අනිවාර්ය ලියාපදිංචිය, රක්ෂණය සහ පුහුණුව, සේවය සඳහා යන පිටරටවල සුභසාධන පහසුකම්, සේවකයන්ගේ දරුවන්ට මෙරට තුළ එබඳු පහසුකම්, පිටත්ව යාමේ වියදම් සහ ආපසු පැමිණෙන පසුව ආදායම් ඉපයීම සඳහා සහනාධාර මත ණය පහසුකම් සහ ඇතැම් රටවල සේවායෝජකයන් සමග ගිවිසුම් අත්සන් කිරීම යන මේ කරුණු සඳහා රජය විසින් විධිවිධාන යොදා තිබේ. එහෙත් සේවකයන් සේවය සඳහා යන රටවල්වල ඔවුන් ආරක්ෂා කෙරෙන ද්විපාර්ශ්වික ගිවිසුම් තවම ඇතිවී නොමැත. දේශීය සේවකයන් ආරක්ෂා කරන එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුතිය අත්සන්කිරීමට මෙම රටවල් අකමැතිවී ඇති නිසා මෙය පුදුමයට කාරණයක් නොවේ.

සිය රටේ සේවයේ යෙදී සිටින සේවකයන් පිළිබඳ මෑතකදී අන්තර්ජාතික කම්කරු සංවිධානය විසින් ඇතිකර තිබෙන සම්මුතියක් මගින් උප කොන්ත්‍රාත් මගින් සේවයේ යොදවන සේවකයන්ගේ අයිතිවාසිකම් හා සේවා තත්ත්වයන් ආරක්ෂා කිරීමට උත්සාහ කරන නමුදු මෙම ආරක්ෂාව ස්වයං-රැකියාවල යෙදී සිටින සෙසු සේවකයන්ට ලැබෙන්නේ නැත. මෙම සම්මුතිය ශ්‍රී ලංකාව විසින් අනුමත

සලකනු ලැබ නැත. ගොවීන්ට, ධීවරයන්ට සහ ස්වයං-රැකියාවල නියුක්ත අයට සමාජ සංරක්ෂණය හඳුන්වා දීමට මෑත අවුරුදුවලදී උත්සාහයන් දරා ඇති නමුදු මෙම ප්‍රතිපත්ති පිළිබඳ දැනුවත් භාවය සීමිත බව පෙනීගොස් ඇති අතර මෙම ක්‍රමවලට දායක වීමට අතිශයින් දුප්පත් අයට හැකියාවක් නොමැත.

මේ අනුව පහත සඳහන් කරුණු අවශ්‍ය බව පෙනී යයි.

- රැකියා නියුක්තියේදී සමාන අවස්ථා ඇති කිරීම පිණිස නීති පැනවීම;
- දැනට පවතින නීති ක්‍රියාත්මක කිරීම;
- කාන්තාවන් සහ ආර්ථික වශයෙන් සහ සමාජය වශයෙන් අහිමි භාවයට පත්ව ඇති පුද්ගලයන් ගොනුවී සිටින අවිධිමත් අංශයට බලපාන පරිදි කම්කරු රෙගුලාසි දීර්ඝ කිරීම;
- විදෙස් සේවය කරන සේවකයන් සුරැකීම සඳහා ද්වි පාර්ශ්වික ගිවිසුම් ඇතිකිරීම ප්‍රවර්ධනය කිරීම;
- වෘත්තීය සමිති නායකත්වයන්හි කාන්තා නියෝජනය වැඩි කිරීම;
- ඉන්දීය ස්වයං-රැකියා කාන්තා සංගමයේ (සේවා) ආකෘතියේ පරිදි ස්වයං-රැකියාවල නියුක්ත කාන්තාවන් සංවිධානය කිරීම;
- සියලු ප්‍රජා කොට්ඨාශ තුළ නෛතික දැනුම හා නීති ආධාර ක්‍රම ව්‍යාප්ත කිරීම.

ISBN 955-582-102-X

Printed By: Unie Arts (Pvt) Ltd.